(100)

" ශ්‍රී ලංකාවේ ගුරු විද්‍යාලවල පුහුණුව ලබන ගුරු සිසුන්, ගුරුවරයාගේ භූමිකාව සංජානනය කරන ආකාරය ආශ්‍රිත අධ්‍යයනයක්"

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති ( M. Phil ) උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ කෘතිය

1985

UCLIB
400720

ඩබ්ලිව්. ඩික්සන් ප්‍රනාන්දු -1981/ M.Phil /05
අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය.

UNIVERSITY OF COLOMBO - SRI LANKA
LIBRARY

## සංක්ෂිප්තය


### ගැටළුවේ වැදගත්කම :-

අධ්‍යාපනයෙහි ආර්ථික වටිනාකමක් ගැබ්ව ඇතැයි යන සංකල්පය ලොව පුරා ප්‍රචලිත වෙත්ම, සැමරටක්ම පාහේ පෙර නොවූ වීරු වගකීමක්, අධ්‍යාපනය මත තවරනු ලැබ ඇත. දේශපාලන නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ද බලයට පත් සැම රජයක්ම පාහේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති කිරීම තුළින් රටේ අනාගත සංවර්ධන කාර්යයෙහි පදනම ඇති කිරීමට වෙහෙසුන බැව් පෙනේ. එමෙන්ම අධ්‍යාපන කටයුතු වෙනුවෙන්, වාර්ෂිකව රාජ්‍ය වැය ශීර්ෂය ඉහළ මට්ටමක් කරා නැඟෙන්නට වූ අතරම, අධ්‍යාපනය කෙරෙහි පැවැති සමාජ ඉල්ලුම ප්‍රසාරණය විය. මේ අනුව රජය, දෙමාපියන්, සිසුන් ඇතුළු මුළු මහත් ප්‍රජාවම අධ්‍යාපනය තුළින් අනේකාර්ථ ( AMBIGUOS ) බලාපොරොත්තු ඉටුකර ගැනීමට අපේක්ෂා කළහ. එම අපේක්ෂා ඉටු කරගනු වස් අවස්ථා කීපයකදීම සැළසුම් කරුවෝ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාශියක් සිදු කරන්නට පෙළඹුනහ. අධ්‍යාපන සැළසුම්, මනා සංවිධාන-යෙන් හා යහපත් කළමනාකාරීත්වයකින් ක්‍රියාත්මක කළද එහි සාර්ථක අසාර්ථක බව අවසාන වශයෙන් රඳා පවත්නේ ගුරුවරයා සතු භූමිකාව මතය. සිය භූමිකාව නිසි අන්දමින් පසක් කර නොගතහොත්, අධ්‍යාපනය කෙරෙහි යොමු වී ඇති අවධානයේ ප්‍රබලබව කරණ කොට ගෙන ගුරුවරයාට එරෙහිව විවිධ චෝදනා එල්ලවනු ඇත. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ගුරුවරයා සතු භූමිකාව පිළිබඳව නිශ්චිත තත්වයක් පවතීයැයි පිළිගත නොහැකි බැවින් ගුරුවරයාගේ භූමිකා ක්ෂෙත්‍රයෙහි අදාල පර්යේෂණ බිහිවීමද අල්ප විය. රටේ සංවර්ධන කාර්යයේදී වටිනා මෙහෙයක් ඉටුකරන ගුරුවරයාගේ භූමිකාව උක්ත දැක්වෙන තත්ත්වයන් යටතෙහි වත්මන් ගුරුවරයා සංජානනය කරන ආකාරය විමසා බැලීම ඉතාම කාලෝචිත ප්‍රයත්නයකි.

මෙම පර්යේෂණයෙහි ප්‍රතිඵල අනාගත අධ්‍යාපන සැළසුම්කරුවන්ගේ අවශ්‍යතාවලට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. විශේෂයෙන් ගුරු පුහුණු ක්ෂෙත්‍රයෙහි වත්මන් ගුරුපුහුණු වැඩ පිළිවෙල සඳහා මෙම පර්යේෂණ ප්‍රතිඵල ඵලදායක වනු ඇතැයි හැඟේ.


UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

අරමුණු:-

නිශ්චිත නිර්වචනයක් නොදැක්වෙන ගුරු භූමිකාව පිළිබඳ සාපේක්ෂවූ ද කාලීන හා ප්‍රායෝගිකවූ ද අර්ථකථනයක් කිරීම.

අධ්‍යාපනයෙන් රජය, දෙමව්පියන්, සිසුන් අපේක්ෂාකරන මූලික අරමුණු, ගුරු විද්‍යාලයෙහි පුහුණුව ලබන ගුරු සිසුන් සංජානනය කරන ආකාරය විමසීම.

විවිධ ගුරු පුහුණු පාඨමාලා හදාරණ ගුරු සිසුන් ගුරුවරයාගේ භූමිකාව සංජානනය කරන ආකාරයේ වෙනසක් පවතීදැයි සොයා බැලීම.

ගුරු පුහුණු අවස්ථාව අනුව සහ ස්ත්‍රී පුරුෂ භේදය අනුව සංජානනයේ වෙනසක් ඇත්දැයි සොයා බැලීම.

පර්යේෂණ අනාවරණයන් ඇසුරින් ක්ෂේත්‍රයට කෙරෙන ඇඟවීම් මතුකොට දැක්වීම.

නියැදිය:-

ගුරු විද්‍යාල පහකින්, පාඨමාලා පහක් අයත්වන ලෙය අහඹු ක්‍රමයට ගුරු සිසුන් 400 ක් තෝරා ගනු ලැබීය. එක් පාඨමාලාවකින් 80 දෙනෙකු අයත්වන ලෙසත්, (ප්‍රථම හා දෙවනවසර යනුවෙන්, ගුරු පුහුණු අවස්ථාව අනුව 40 බැගින්) ස්ත්‍රී, පුරුෂ වශයෙන් මිශ්‍රව අහඹු ක්‍රමයට තෝරා ගනු ලැබීය.

පර්යේෂණ සැලැස්ම:-

සමාජ විද්‍යා ක්ෂේත්‍රයෙහි සිදු කෙරෙන විස්තරාත්මක පර්යේෂණයකි. ගුරුවරයා සතු භූමිකාවෙහි අන්තර්ගතය සොයා බැලීම සඳහා අදාල සාහිත්‍ය කෘති ගනනාවක් පරිශීලනයට ලක්විය. විශේෂයෙන් 1943 සිට අද දක්වා මෙරට සිදු කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සියල්ලම පාහේ පරිශීලනය කරන්නට යෙදුනි. අධ්‍යයන අමාත්‍යාංශයේ නිලධරයන්, දෙමව්පියන් හා සිසුන් සමඟ සම්මුඛව සාකච්ජා පැවැත්වීම තුලින් ඔවුන් ගුරුවරයා සතු භූමිකාවෙන් අපේක්ෂා-

කරන දෑ පැහැදිලි කර ගතිමි. (181 දෙනෙකු සමග සම්මුඛව සාකච්ඡා තීප වාරයක්ම පැවැත්වීමට සිදුවිය.)

උක්ත දැක්වෙන පරිදි අදාළ සාහිත්‍ය පරිශීලනයෙන් හා සම්මුඛ සාකච්ඡාවලින් අනතුරුව ප්‍රශ්නාවලිය සකස් කොට එය පර්යේෂණ ක්ෂෙත්‍රයෙහි අත්දැකීම් බහුල පර්යේෂකයන් තිදෙනෙකු ලවා පරීක්ෂා කොට වලංගුතාවය සහතික කොට ගතිමි. අවසානයෙහි තෝරාගනු ලැබූ නියැදිය (400) සඳහා ප්‍රශ්නාවලිය දෙන ලදි. ඉන් ලද ප්‍රතිචාර ප්‍රධාන අංශ පහක් යටතෙහි වෙන් වෙන්ව, ප්‍රතිශත භාවිතය තුළින් විශ්ලේෂණය කරන ලද්දේය.

<u>නිගමන සහ යෝජනා</u>:-

ගුරුවරයා සතු භූමිකාව පහත දැක්වෙන පරිදි ඉතා කෙටියෙන් නිර්වචනය කළ හැකිය. "ජාතික අධ්‍යාපන සැලැස්මේ අරමුණු සාර්ථක කරනු වස්, අදාල සම්පත් උපයෝගී කොට ගෙන, රටේ සංවර්ධන ක්‍රියාවලියේ ක්‍රියාකාරී සහභාගීත්වය දැරීම හා අන්තර් ජාතික වශයෙන් අවබෝධය, අන්‍යෝන්‍ය සහයෝගය අගයන ජාත්‍යන්තර සාමකාමී මානවයා සකස් කිරීම"

ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්ය හා දැනට ක්‍රියාත්මක වන අධ්‍යාපනයේ අරමුණු අතර යහපත් සබඳතාවක් නැතැයි යන්න පිළිබඳ හැඟීමක් ගුරුවරයා තුළ ඇති බව, ගුරුවරයාගේ භූමිකාවෙන් රජය අපේක්ෂිත අරමුණු සංජානනය කිරීමේදී පෙනේ. තවද දෙමව්පියන් ගුරුවරයාගේ භූමිකාවෙන් අපේක්ෂිත අරමුණු හා සිසුන් ගුරුවරයාගේ භූමිකාවෙන් අපේක්ෂිත අරමුණු අතර සබඳතාවයක් නැත.

දැනට ගුරුවරයා සතු කුසලතාවය දියුණු නොකළාට ගුරුවරයාගේ භූමිකාවේ කාර්යක්ෂමතාවයට හානියක් නොවේයැයි යන්න පිළිබඳව 52.25% ක් එකඟ වී සිටිති. මෙය ගුරු වෘත්තියේ තත්ත්වය ඉහළ නැංවීමට ඇති බාධකයක් ලෙස පෙනේ.

ගුරුවරයා සතු වරප්‍රසාද හා අයිතිවාසිකම් භුක්තිවිඳීම පිළිබඳව දක්වා ඇති කැමැත්තේ ඒකඟතාවය 73.36% කි. එහෙත් මුළු මහත් සමාජයම ගුරුවරයාගෙන් සිය වෘත්තියට ඇපකැපවීම අපේක්ෂිත යුගයක උක්ත සංජානනයෙන්, සමාජයේ අපේක්ෂණ ඉටුනොවේයැයි පෙනේ.

ගුරුවරයා යහපත් පැවැත්මක්, අවශ්‍යයෙන්ම පවත්වා ගැනීම කළ යුතු යැයි සංජානනය තොට තිබීම වැදගත් ලක්ෂණයකි. නමුත් විවිධ ජන සන්නිවේදන මාධ්‍යයන් මඟින් දක්වනුයේ මීට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයකි.

ගුරු වෘත්තියට පිවිසෙන  නවක ගුරු පිරිසට බාහිර කටයුතු ක්ෂේත්‍රයෙහි විවිධ වගකීම් දැරීමේ අවස්ථාවක් ලැබී නැත. එනිසා ඔවුන්ගේ භූමිකාවෙන් සමාජයට ලැබිය යුතු නිසි ඵලය නොලැබී යනු ඇත.

ස්ත්‍රීන් තුළ පිරිමින්ට වඩා දැඩි හරඟකාරී ස්වභාවයක් මතුවී පෙනේ. අධික භූමිකා ගැටුම් ගුරු මහත්මීන් තුළ වැඩි වශයෙන් පවතින බැව් ප්‍රත්‍යක්ෂවේ. තවද 37.71% ක් ගුරුවරයාගේ කාර්යය පාසැල් කාලයට පමණක් සීමා කළ යුතු බැව් පිළිගෙන ඇති බැවින් වත්මන් වාණිජ සමාජයේ යථාර්ථයට ගුරුවරයා ලංවී ඇති බැව් ප්‍රකාශ කල හැකිය.

ගුරු පුහුණු පාඨමාලා අනුව බොහොදුරට කැපී පෙනෙන වෙනසක් දක්නට නොලැබේ. එසේම බොහෝ අවස්ථාවන්හි ප්‍රථම හා දෙවන වසර ගුරු සිසුන්ගේ සංජානනයෙහි අසමානත්වයක් දක්නට නොලැබීමෙන් පෙනීයනුයේ, ගුරු පුහුණුව තුළින්, ගුරු සිසුන්ගේ භූමිකාවෙහි ආකල්පමය වෙනසක් ඇති කිරීමට තරම් හැකියාවක් ගුරු විද්‍යාලවලට නැති බවය. මේ නිසා වත්මන් ගුරු පුහුණු වැඩ පිළිවෙලෙහි, ගුණාත්මක පරිවර්තනයක් සිදුකළයුතු අවස්ථාව උදාවී ඇතැයි නිගමනය කළ හැක.

UNIVERSITY OF COLOMBO
LIBRARY
SRI LANKA